**අකුරැස්ස ප්‍රාදේශීය සභාව**

**2024 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම**

මෙහි පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම හා සේවා සිදු කිරීම සඳහා ලියාපදිංචි වීමට කැමැත්ත දක්වන සැපයුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් එවනු ලබන ලිපි කවරයේ ඉහළ වම්පස කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදංචි කිරීම - 2024 වර්ෂය"** යනුවෙන් සඳහන් කර **2023.11.30** වන දින පස්වරු **3.00** ට පෙර **ලේකම්, ප්‍රාදේශීය සභාව, අකුරැස්ස** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැක.

**01)** සැපයුම් **:**

I. කාර්යාලීය ලිපි ද්‍රව්‍ය , මුද්‍රිත පොත්,සඟරා, පරිගණක මුද්‍රණ ද්‍රව්‍ය හා පරිගණක පාරිභෝගික ද්‍රව්‍ය.
II. සියලුම ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය, ජල නල උපකරණ,ජල මනු,ජල මෝටර් හා තීන්ත වර්ග ආශ්‍රිත ද්‍රව්‍ය,සෞඛ්‍ය ආරක්ෂිත උපකරණ,විදුලි සේවා ආශ්‍රිත ආරක්ෂිත උපකරණ (ඉදල්, කොසු, බුරුසු, පාපිසි, වේවැල් කූඩ, ප්ලාස්ටික් කුණු කූඩ, විම්, සබන්, හාපික් හා විෂබීජ නාශක, අත් වැසුම්, මුහුණු ආවරණ, වැහි කබා, ගම් බූට්ස්, සපත්තු, මේස් ආදිය)
III. නිල ඇඳුම් සඳහා රෙදි ,සපත්තු ,මේස් හා තිර රෙදි සඳහා අවශ්‍ය රෙදි වර්ග සැපයීම හා මැසීම.
IV. සියලුම ක්‍රීඩා උපකරණ, ක්‍රීඩා ඇඳුම් හා සෙල්ලම් බඩු (ළමා උද්‍යාන හා ව්‍යායාම උපකරණ)
V. ටයර්,ටියුබ්,බැටරි හා සියලුම රථ වාහන අමතර කොටස් සැපයීම හා වාහන විදුලි පද්ධති සැකසීම හා අළුත්වැඩියාව
VI. විදුලි හා වීථි පහන් උපකරණ, වයරින් ද්‍රව්‍ය හා විද්‍යුත් උපකරණ හා CCTV උපාංග සැපයීම.
VII. පරිගණක යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, අනුපිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර,වේලාව සටහන් කිරීමේ උපකරණ හා ආශ්‍රිත උපාංග සැපයීම හා අලුත්වැඩියාව.
VIII. කාර්යාල උපකරණ, ලී, වීදුරු සහ වානේ ගෘහ භාණ්ඩ ආදිය .
IX. කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන (හියුම් පයිප්ප, කොන්ක්‍රීට් කණු, මායිම් ගල්,බෝක්කු බට,කම්බි කණු ආදිය)
X. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය දැව වර්ග, ලී, ලෑලි සැපයීම.
XI. තාර, ප්‍රීමික්ස්, කළුගල්, වැලි, පස් හා බොරළු ඇතුළු මාර්ග නඩත්තුවට අදාළ ද්‍රව්‍ය හා උපකරණ.
XII. ගිනි නිවීමේ උපකරණ ස්ථාපිත කිරීම හා අළුත්වැඩියාව.
XIII. සියලුම ඇලුමිනියම් ,සුදු යකඩ වැඩ හා පෑස්සුම් කටයුතු.
XIV. උදලු,සවල්,රේක්ක,කැති,පිහියා,වල් කපන යන්ත්‍ර තල, මුල්ලු, විල්බැරෝ, වතුර මෝටර් හා අලවංගු ආදී අනෙකුත් කම්කරු උපකරණ, කෘෂි උපකරණ සහ ආයුධ.
XV. බැනර්,කොඩි, ඩිජිටල් ප්‍රින්ටින්,පෝස්ටර්,ආරාධනා පත්‍ර හා ස්ටිකර්,සමරු ඵලක හා නිල මුද්‍රා සකස් කිරීම.

**02)** වැඩ හා සේවා සැපයීම

I. ද්‍රව්‍ය ප්‍රවාහන හා මගී ප්‍රවාහන සඳහා වාහන, උපකරණ,ස්කැවේටර් හා බොබ්කැට් යන්ත්‍ර , බැකෝ රථ ,මාර්ග සැකසීම් උපකරණ වැනි යන්ත්‍ර සූත්‍ර කුලී පදනම මත සැපයීම. ගලි බවුසර් ඇතුළු සියලු පවිත්‍රකරණ සේවා සැපයීම.
II. මෝටර් ග්‍රේඩර්, බැකෝ රථ, විදුලි ජනක යන්ත්‍ර, චේන්සෝ යන්ත්‍ර, තණකොළ කපන යන්ත්‍ර, බොබ්කැට් යන්ත්‍ර ආදී යන්ත්‍ර සූත්‍ර සේවා කිරීම හා අලුත්වැඩියාව.
III. රක්ෂණ සේවා සැපයීම, නීතිඥ සේවා සැපයීම, මිනින්දෝරු සේවා සැපයීම
IV. ආදාහනාගාර හා ගොඩනැගිලි යන්ත්‍රෝපකරණ නඩත්තු සේවා සැපයීම.
V. භාෂා පරිවර්තන සේවා සැපයීම.
VI. පරිගණක ජාලගත කිරීම හා අභ්‍යන්තර දුරකථන සේවා සැපයීම.
VII. ගස් කැපීම, වඩු උපකරණ සැපයීම හා සැකසීම.
VIII. සියලුම වාහන අලුත්වැඩියාව හා සේවා සිදු කිරීම. (කුෂන් කිරීම, ටෙන්ට් මැසීම, සීට් කවර හා කැනපි ගැසීම.)
IX. ගොඩනැගිලි,මාර්ග ඉදිකිරීම් හා නඩත්තු සේවා ,කොන්ත්‍රාත් රු. ලක්ෂ පහට වැඩි හා අඩු ලෙස

**කොන්දේසි,**

- අයදුම්පත් කැඳවීමේ අවසන් දිනෙන් පසු දිනකදී මුදල් ගෙවා ලබා ගත් රිසිට්පත්, චෙක්පත් හෝ මුදල් ඇණවුම් මත සිදු කරන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ඉහත සඳහන් එක් එක් වර්ගයන් වෙනුවෙන් වෙන වෙනම ඉල්ලුම් කළ යුතු අතර, ඒ සඳහා වෙන් වෙන් වශයෙන් මුදල් ගෙවිය යුතුය.
- ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කරන සෑම අයදුම්පතක් සමඟම ලියාපදිංචි ගාස්තුව වශයෙන් රු. 500.00 ක මුදලක් අය කරනු ලබන අතර, එම මුදල සතියේ වැඩ කරන දිනවල පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා කාර්යාලයට ගෙවිය හැක. චෙක්පත් මගින් ගෙවීම් සිදු කරනු ලබන්නේ නම් ලේකම්, අකුරැස්ස ප්‍රාදේශීය සභාව යන නමින් යොමු කළ යුතුය.
- 2024 වර්ෂය තුළ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සාමාන්‍යයෙන් මිල ගණන් කැඳවනු ලබන අතර, අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවල ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් පරිබාහිරව මිල ගණන් කැඳවීම හා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ අයිතිය සභාව සතුය.(ප්‍රා.ස මුල්‍ය හා පරිපාලන රීති 178 (3) අනුව
- ඉදිරිපත් කරනු ලබන මිල ගණන් මාස 06 ක් වලංගු විය යුතු අතර දින 30 ක් ඇතුළත ගෙවීමේ පදනම මත භාණ්ඩ හා සේවා සැපයීමට එකඟ විය යුතුය.
- මේ සඳහා වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළදී පැමිණ හෝ පහත සඳහන් දුරකථන අංකයෙන් විමසා දැනගත හැකිය. 041-2283275
- මේ සඳහා තමා විසින් ම පිළියෙල කරන ලද අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ හැකි අතර, අප වෙබ් අඩවිය (www.akuressaps.lk) වෙත පිවිස අයදුම්පත්‍රය බාගත කිරීමද සිදු කල හැක.

**අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවෙකු වීමට තිබිය යුතු නිර්ණායකයන්,**

- සංස්ථාවක් නම් සංස්ථාවක් බවට නීති ගත කළ සහතිකය
- තනි පුද්ගල ව්‍යාපාරයක් නම් ලියාපදිංචි සහතිකය
- සමාගමක් නම් සමාගම් පනත අනුව ලියාපදිංචි කිරීමේ සහතිකය
- මීට පෙර රාජ්‍ය ආයතනවලට භාණ්ඩ සැපයුම් කර ඇත්නම් පමණක් ඒ පිළිබඳව විස්තර
- වාහන සඳහා නම් දකුණු පළාත් සභාවේ අනුමත මෝටර් රථ ගරාජයක් වීම විශේෂ සුදුසුකමකි.
- වගකීම් කාලයක් සඳහා වන භාණ්ඩ හා සේවා වෙනුවෙන් වගකීම් කාලය සඳහන් කළ යුතුය.
- වෙනත් විශේෂ සුදුසුකම් ඇත්නම් සඳහන් කරන්න.

ඉල්ලුම් කළ විට මිළ ගණන් ඉදිරිපත් නොකරන, ඇණවුම් කළ විට භාණ්ඩ සැපයීමට අපොහොසත් වන සැපයුම්කරුවන්ගේ ද, නියමිත ප්‍රමිතියෙන් තොර භාණ්ඩ හා සේවා සපයනු ලබන සැපයුම්කරුවන්ගේ ද, ලියාපදිංචිය අවලංගු කොට එම ආයතනයේ නම අසාධු ලේඛනගත කරනු ලැබේ.

2023 නොවැම්බර් 10 වන දින,
අකුරැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේදී

ඩබ්.ආර්.ප්‍රභාත් නිමේෂ
ලේකම්,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.